# ශ්‍රී ලංකා නීති විද්‍යාල ප්‍රවේශ විභාගය

## 2021 අධ්‍යයන වර්ෂය සඳහා සිසුන් ඇතුළත් කර ගැනීම

ශ්‍රී ලංකා නීති විද්‍යාලයේ 2021 අධ්‍යයන වර්ෂයට සිසුන් ඇතුළත් කරගැනීම සඳහා අයදුම්පත් 2020 ජූලි මස 09 වන දින පෙරවරු 9.00 සිට 2020 අගෝස්තු මස 10 වන දින පස්වරු 3.00 දක්වා ශ්‍රී ලංකා නීති විද්‍යාල වෙබ් අඩවියෙන් (www.sllc.ac.lk) බාගත කළ හැක.

### ඇතුළත්වීමේ සුදුසුකම්

**ශ්‍රී ලංකා නීති විද්‍යාල ප්‍රවේශ විභාගයට පෙනී සිටීම සඳහා තිබිය යුතු අවම සුදුසුකම් මෙසේය :**

(අ) නව විෂය නිර්දේශය යටතේ ශ්‍රී ලංකා අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයෙන් (එනම් 2000 අගෝස්තු විභාගය සහ ඉන් පසුව) එකවර විෂයන් තුනක් සමත්ව තිබීම (සාමාන්‍ය ඉංග්‍රීසි සහ සාමාන්‍ය දැනීම යන විෂයන් හැර) එසේ වුවද, පැරණි විෂය නිර්දේශය යටතේ ඉහත විභාගයට පෙනී සිටි පුද්ගලයකු එකවර විෂයන් හතරක් සමත්ව තිබිය යුතුයි.

සහ

(ආ) ශ්‍රී ලංකා අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේදී හෝ ජාතික පොදු සහතික පත්‍ර විභාගයේදී ඉංග්‍රීසි භාෂාව සහ සිංහල හෝ දෙමළ භාෂාව යන විෂයන් සඳහා සම්මාන සාමාර්ථ තිබිය යුතුයි ;

(ඇ) අයදුම්පත් භාරගැනීම අවසන් වන දිනට අයදුම්කරුවන් වයස අවුරුදු 17 සම්පූර්ණ කර තිබිය යුතුයි.

වැඩිදුර විස්තර සහ වෙනත් සුදුසුකම් සඳහා කරුණාකර ශ්‍රී ලංකා නීති විද්‍යාලයීය වෙබ් අඩවියට පිවිසෙන්න (www.sllc.ac.lk)

### ප්‍රවේශ විභාගය

සියලු අයදුම්කරුවන් 2020 ඔක්තෝබර් මස කොළඹදී පමණක් පැවැත්වීමට නියමිත ප්‍රවේශ විභාගය සඳහා පෙනී සිටිය යුතුයි.

**නීති විද්‍යාල ප්‍රවේශ විභාගය සඳහා අන්තර්ගත වන ප්‍රශ්න පත්‍ර මෙසේය :**

01. භාෂා හැකියාව
02. සාමාන්‍ය දැනීම සහ සාමාන්‍ය බුද්ධිය

### අයදුම්පත සඳහා විභාග ගාස්තු සඳහා ගෙවීම්

අයදුම්පත, පසුගිය සහ ආදර්ශ විභාග ප්‍රශ්න පත්‍ර ඇතුළු අදාළ තොරතුරු නීති විද්‍යාල වෙබ් අඩවියෙන් බාගත කළ හැකිය. (www.sllc.ac.lk)

නිසි ලෙස සම්පූර්ණ කළ අයදුම්පත සමග ප්‍රවේශ විභාගය සඳහා වන විභාග ගාස්තුව වශයෙන් ගෙවන ලද රු. 6,000/- ක බැංකු ලදුපතේ මුල් පිටපත ඉදිරිපත් කළ යුතුය. මෙම විභාග ගාස්තුව කිසිදු අවස්ථාවක ආපසු ගෙවනු නොලැබේ.

ඉහත සඳහන් ගෙවීම පහත පරිදි හැටන් නැෂනල් බැංකුවේ (HNB) හෝ ලංකා බැංකුවේ (BOC) ඕනෑම ශාඛාවකින් කළ හැකිය. හැටන් නැෂනල් බැංකුවේ අළුත්කඩේ ශාඛාවේ ගිණුම් අංක 063010004875 දරන හෝ ලංකා බැංකුවේ අළුත්කඩේ ශාඛාවේ ගිණුම් අංක 0001369779 දරන සංස්ථාගත නීති අධ්‍යාපන සභාව නමින් ඇති ගිණුමට බැර වන පරිදිය.

කරුණාකර ඔබගේ ජාතික හැඳුනුම්පත් අංකය, මුලකුරු සමග නම සහ දුරකථන අංකය බැංකු ලදුපතේ සටහන් කරන්න.

### අයදුම්පත් භාරගන්නා අවසන් දිනය

නිසි ලෙස සම්පූර්ණ කළ අයදුම්පත සමග අධ්‍යාපන සහතිකවල ඡායා පිටපත් 2020 අගෝස්තු මස 10 දින හෝ ඊට පෙර ඕනෑම වැඩකරන දිනයක පෙරවරු 9.00 සිට මධ්‍යහ්න 12.00 දක්වාත් පස්වරු 1.30 සිට පස්වරු 3.30 දක්වාත් නො. 244, අළුත්කඩේ විදිය, කොළඹ 12 හි පිහිටි ශ්‍රී ලංකා නීති විද්‍යාලයේ විදුහල්පති තුමිය / තුමා වෙත භාරදිය යුතුය. (ප්‍රමාද වූ අයදුම්පත් කිසිවක් භාරනොගන්නා බව කරුණාවෙන් සලකන්න.)

**විදුහල්පති,**
**ශ්‍රී ලංකා නීති විද්‍යාලය,**
**නො. 244, අළුත්කඩේ වීදිය,**
**කොළඹ 12.**